CSIAP

THE WORLD BANK

# දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (CSIAP)

## කෘෂිකර්ම අමාත්‍යාංශය

## ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

**ලෝක බැංකුව විසින් අරමුදල් සපයා, කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (CSIAP) වසර 5 ක කාලයක් සඳහා වේ. ව්‍යාපෘතියෙහි අරමුණ වනුයේ පළාත් හයක, එනම් වයඹ, උතුරු මැද, නැගෙනහිර, උතුරු, දකුණු හා ඌව පළාත්වල හඳුනාගත් දේශගුණිකව අවදානම සහිත ස්ථානීය ප්‍රදේශවල දේශගුණ අවබලපෑම් අවම කළ හැකි කෘෂිකර්මය වැඩි දියුණු කිරීම හරහා කෘෂිකර්ම ඵලදායිතාව වර්ධනය කිරීම වේ. ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකන් ඩොලර් මිලියන 125 කි.**

**ව්‍යාපෘතියෙහි පහත සඳහන් තනතුරු සඳහා, ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන්, එක් එක් වර්ගීකරණයන් යටතේ සඳහන් සුදුසුකම් හා පළපුරුද්ද සතු අය විය යුතුය.**

### 01. නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ ( PS2) - තනතුරු 01 - ඌව පළාත

**සුදුසුකම් - පහත (අ) හෝ (ආ) හෝ (ඇ)**

අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම **හෝ** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම් **හෝ** පිළිගත් වෘත්තීය ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකම් **සමග** අවම වශයෙන් **වසර 13 ක**, කළමනාකරණ තලයේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද තිබිය යුතු අතර, එයින් වසර 06 ජ්‍යෝෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය.

ආ) විශ්වවිද්‍යාලයේ ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ, ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම **හෝ** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම් සහ පිළිගත් වෘත්තීය ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ ආයතනික වරලත් සාමාජිකත්වය හෝ සමාන සුදුසුකම් **හෝ** අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් සමග අවම වශයෙන් **වසර 11 ක** කළමනාකරණ තලයේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද තිබිය යුතු අතර, එයින් **වසර 5** ජ්‍යෝෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය.

ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම **හෝ** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බව පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් **සමග** අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් **සහ** ආයතනික වරළත් සාමාජිකත්වය **හෝ** අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකම් **සමග වසර 09 ක** කළමනාකරණ තලයේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද තිබිය යුතු අතර, එයින් **වසර 4 ක්** ජ්‍යෝෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය.

රජයේ දීපව්‍යාප්ත සේවයේ I පංතිය නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තනතරක් **සමග** අවම වශයෙන් වසර 05 ක I පංතිය තනතුරක පළපුරුද්ද.

**කෙටි රැකියා විස්තරයක් :**

පළාතේ සියලුම අදාළ පාර්ශ්වකරු නියෝජිතායතන සමග ඉතා සමීප සහයෝගිතාවයක් පවත්වා ගනිමින්, පළාතේ අවදානම සහිත ප්‍රදේශවල එල්ලංගා පද්ධති සංවර්ධනය සැලසුම් කොට, සංවර්ධනය කොට ක්‍රියාත්මක කොට, පවත්වාගෙන යාම අයත්වේ.

### 02. මූල්‍ය කළමනාකරණ විශේෂ (PS3) - තනතුරු 01 - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
### 03. දේශගුණ සුහුරු කෘෂිකර්ම විශේෂඥ (PS3) - තනතුරු 01 - දකුණු පළාත

**සුදුසුකම් - පහත (අ) හෝ (ආ) හෝ (ඇ)**

අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම **හෝ** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම් **හෝ** අදාළ ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තිය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තිය සුදුසුකම් **සමග** සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 12 ක කළමනාකරණ තලයේ පළපුරුද්ද.

ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම් හෝ අදාළ ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්ව/ සමාන වෘත්තීය සුදුසුකම් සහ අදාළක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් සමග සුදුසුකම් ලැබීමෙන් පසු කළමනාකරණ තලයේ අවම වශයෙන් වසර දෙකක පළපුරුද්ද.

ඇ) රජයේ දීපව්‍යාප්ත සේවයේ පංතිය I නිලධාරියෙකු හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තනතුරක් **සමග** පංතිය I තනතුරක අවම වශයෙන් වසර 4 ක පළපුරුද්ද.

**මූල්‍ය කළමනාකරණ විශේෂඥ සඳහා කෙටි රැකියා විස්තරයක් :**

මූල්‍ය හා ගිණුම් ආශ්‍රිත කරුණු CSIAP ව්‍යාපෘතිය ජාතික මට්ටමින් සලකා බලා එම ව්‍යාපෘතියෙහි මූල්‍ය හා වියදම් කළමනාකරණ පද්ධතිය ගොඩනැගිය යුතු අතර, ශ්‍රී ලංකා රජයේ මූල්‍ය නියමයන් පිළිපදිමින් ලෝක බැංකුව විසින් අරමුදල් සැපයූ ව්‍යාපෘති සඳහා නිර්දිෂ්ඨ ක්‍රියාපටිපාටීන් දැඩිව අනුගමනය කළ යුතුය.

**දේශගුණ සුහුරු කෘෂිකර්ම විශේෂඥ සඳහා කෙටි රැකියා විස්තරයක් :**

සමස්ත කෘෂිකාර්මික සංවර්ධන කාර්ය රාමුවක් හා උපාය මාර්ග, අදාළ අවදානම සහිත ප්‍රදේශවල සංවර්ධනය කළ යුතු අතර, අවදානම සහිත ප්‍රදේශවල දේශගුණ සුහුරු කෘෂිකර්ම (CSA) තාක්ෂණ හා පරිචයන් හා ආශ්‍රිත ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කළ යුතුය.

### 04. ප්‍රසම්පාදන නිලධාරි (PS6- වර්ගීකරණය - A) තනතුරු 01 - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
### 05. අධීක්ෂණ හා අගැයුම් නිලධාරී (PS6 - වර්ගීකරණය - A) තනතුරු 01 - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

**සුදුසුකම් හා පහත (අ) හෝ (ආ) හෝ (ඇ)**

අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් **හෝ** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම් **හෝ** පිළිගත් වෘත්තීය ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකම් **හෝ** තෘතියක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුක්ම 7 තලයට නොඅඩු තනතුරට අදාළ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. **සමග** අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 3 ක පළපුරුද්ද.

ආ) තෘතියක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ අදාළ ක්ෂේත්‍රයේ තනතුරට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් 6 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම **සමග** අදාළ ක්ෂේත්‍රයේ, සුදුසුකම් ලැබීමෙන් පසු, අවම වශයෙන් වසර 8 ක පළපුරුද්ද.

ආ) තෘතියක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ අදාළ ක්ෂේත්‍රයේ තනතුරට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම **සමග** සුදුසුකම් ලැබීමෙන් පසු, අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද.

**ප්‍රසම්පාදන නිලධාරීගේ කෙටි රැකියා විස්තරයක් :**

ප්‍රසම්පාදන නිලධාරී, විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි ක්‍රියාත්මක වැඩ හා භාණ්ඩ ප්‍රසම්පාදන කටයුතු සඳහා සහාය විය යුතු අතර, එම කාර්යයට, ඇතුළත්වන හා එයට සීමා නොවූ, ලෝක බැංකුවේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා ව්‍යාපෘති ලේඛනවලට සහතික කෙරෙන ශ්‍රී ලංකා රජයේ මාර්ගෝපදේශවලට අනුගාමීව ප්‍රසම්පාදන සැලසුම් ලංසු ලේඛන හා සබැඳි ලේඛන සකස් කිරීම කළ යුතුය. එසේම, ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවලට, ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ප්‍රගති වාර්තාකරණය හා ලේඛන පාලන කටයුතුවලට අදාළ රෙජිස්ට්‍රාර් හා ලිපිගොනු සකස් කිරීම හා පවත්වාගෙන යාම සඳහා සහාය විය යුතුය.

**අධීක්ෂණ හා අගැයුම් නිලධාරීගේ කෙටි රැකියා විස්තරයක් :**

M & E නිලධාරියා විසින්, අධීක්ෂණ හා අගැයුම් විශේෂඥ හට පහසුකම් සපයමින් හා සහාය වෙමින්, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (DPDO) කාර්යාලයට අනුයුක්ත M&E නිලධාරීන් සමග සමීප සම්බන්ධීකරණයෙන්, ප්‍රගති වාර්තා සැකසීම සඳහා මාසික යෙදවුම්, ප්‍රතිදානය හා ප්‍රතිඵල තොරතුරු සකස් කිරීම, තහවුරු කිරීම හා සම්පාදනය කිරීම තුළින් සමස්ත ව්‍යාපෘති අධීක්ෂණ හා අගැයුම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුය. ඔහු / ඇය, පළාත් කාර්යාලවල M&E නිලධාරීන්ගේ සහායෙන්, අදාළ පද්ධතිය යාවත්කාලීනව තබා ගැනීම සඳහා ව්‍යාපෘතියේ MIS පද්ධතිය නඩත්තු කොට පවත්වා ගැනීමේ වගකීමද දරයි.

### 6. දත්ත යෙදවුම් ක්‍රියාකරු (සහායක කාර්ය මණ්ඩලය) - තනතුරු 01 ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

**සුදුසුකම් : පහත (අ)**

අ) අ.පො.ස. (උ/පෙළ) විභාගය, එක් වරකදී (පොදු ප්‍රශ්න පත්‍රය හැර) සියලු විෂයන්ගෙන් ද සහ අ.පො.ස (සා/පෙළ) විභාගය, එක් වරකදී ඉංග්‍රීසි, සිංහල / දෙමළ භාෂාව හා ගණිතය විෂයයන් ඇතුළත්ව විෂයයන් හතරකට (4) සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (6) ද සමත් වීම.

**සමග**

පරිගණක යෙදවුම් ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 තලය සමග පරිගණක සාක්ෂරතාවය (MS පැකේජ, අන්තර්ජාල, ඊමේල්) අවම වශයෙන් වසර 3 ක පළපුරුද්ද.

**දත්ත යෙදවුම් ක්‍රියාකරුගේ කෙටි රැකියා විස්තරයක් :**

අදාළ දත්ත යෙදවුම් ක්‍රියාකරු විසින්, වර්තමාන දත්ත යෙදවුම් හා සත්‍යාපනය සඳහා ප්‍රභව සකස් කිරීම, අස්ථානගත දත්ත ලබාගැනීම, පරිගණක හෝ වෙනත් උපකරණ මගින් පද්ධතියට දත්ත ඇතුළත් කිරීම, මයික්‍රොසොෆ්ට් ඔෆිස් ස්විට් සමග කටයුතු කරමින් රහස්‍ය තොරතුරු තබාගනිමින් සංවිධානයේ දත්ත පවත්වා ගැනීම කළ යුතුය.

**අමතර සුදුසුකම් :**

- පෝස්ටර්, අත්පත්‍රිකා නිර්මාණය කිරීම, විඩියෝ සංස්කරණය, නිශ්චල හා වීඩියෝ කැමරා භාවිතයේ ප්‍රායෝගික පළපුරුද්ද, ෆොටෝ ෂොප් හා ඇඩෝබ් ප්‍රිමියර් සම්බන්ධ ප්‍රායෝගික පළපුරුද්ද, නිවැරදි යතුරුලියන කුසලතා, වාචික හා ලිඛිත සන්නිවේදන කුසලතා , පරිගණක දෘඩාංග හා මෘදුකාංග පිළිබඳ දැනුම හා ස්වාධීනව කටයුතු කිරීමට ඇති උනන්දුව.

**පොදු කොන්දේසි :**

1) වයස් සීමාව – අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට අවුරුදු හැටහතරක් (64) විය යුතුය.

2) සියලුම පත් කිරීම් මූලිකව වසර එකක කාලයක් සඳහා වන අතර, සාර්ථක කාර්යසාධනය මත පදනම්ව දීර්ඝ කිරීම් සිදුකළ හැක.

3) සේවක මණ්ඩල සාමාජිකයන්, අවශ්‍යතා පරිදි ව්‍යාපෘති වැඩබිම් වෙත සංචාරය කළ යුතුය.

4) විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතිවල සේවය කොට පළපුරුද්ද සහිත අයවළුන්හට ප්‍රමුඛතාව හිමිවේ.

5) ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය හා පරිගණක සාක්ෂරතාවය සහ රජයේ නියමයන් හා රෙගුලාසි සම්බන්ධ හුරුපුරුදුතාවය අවශ්‍ය වේ.

6) එක් එක් තනතුරක් සඳහා වන වැටුප්, 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 චක්‍රලේඛය මත පදනම්ව සිදු කෙරේ.

### 7) සුදුසුකම් හා පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කළ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

**අයදුම්පත් :**

- සියලුම අයදුම්පත්, අදාළ ජීවදත්ත, ඥාති නොවන නිර්දේශකයන්ගේ නම් හා ඇමතුම් අංක, සියලු සහතිකවල පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන්, පහත සඳහන් ලිපිනය වෙත එවීමෙන් හෝ ඊමේල් අංක – pdcsiap@gmail.com වෙත එවීමෙන්, 2022 අගෝස්තු 22 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ**
**දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය,**
**කෘෂිකර්ම අමාත්‍යාංශය, 61/1, එම්.ඩී.එච්. ජයවර්ධන මාවත,**
**මාදින්නාගොඩ, රාජගිරිය.**

- දැනට රජයේ / අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්, තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුය.
- අයදුම්පත බහාලූ අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ, අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.
- ඉහත බඳවා ගැනීම් සම්බන්ධයෙන්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන හා ඒකායන තීරණය වේ.

**අවශ්‍ය වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර, www.csiap.lk වෙත පිවිසෙන්න.**

**ලේකම්**
**කෘෂිකර්ම අමාත්‍යාංශය**